# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1914/37 – 2015 මැයි 15 වැනි සිකුරාදා – 2015.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාඩුක්කුඩා නමැති ගමේ පිහිටි වව්නියා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එම්ජ්/එම්එන්එන්/2014/237 සහ 2014.11.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 4.1758ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – සෙල්වරිවත්ත – ප්‍රමාණය: හෙක්. 4.1758

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හිමිකම් කියන සෙල්වරිවත්ත, අඩිපාර සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කසාන් මොහිදීන් සහ වෙනත් අය හිමිකම් කියන සෙල්වරිවත්ත; දකුණට: කසාන් මොහිදීන් සහ වෙනත් අය හිමිකම් කියන සෙල්වරිවත්ත සහ එම්. කේ. එම්. සායිසා උම්මා හිමිකම් කියන සෙල්වරිවත්ත; බටහිරට: එම්. කේ. එම්. සායිසා උම්මා සහ තවත් අය හිමිකම් කියන සෙල්වරිවත්ත, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හිමිකම් කියන සෙල්වරිවත්ත සහ අඩිපාර.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014/ඩී/195.
2015 මැයි මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 805